පානදුර ප්‍රදේශීය සභාව - 2022
--------------------------------------

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** තත්ත්වාගණනය කළ මතය

පානදුර ප්‍රදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පානදුර ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රදේශිය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රදේශිය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රදේශිය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධ වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලින් බැහැරවීම.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියේ පරිච්ඡේද 6.3 වගන්තිය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන්ව ගිණුම්ගත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති වටිනාකම රු.266,798,885 ක් වූ ඉඩම් ගොඩනැගිලි වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 ගිණුම් වර්ෂය තුළ ඉඩම් හා ගොඩනැගිලි වෙන්ව හඳුනා ගැනීම නව තක්සේරුවක් මඟින් සිදු කරන බව. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතිය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉහත ප්‍රමිතියේ 6.15 වගන්ති ප්‍රකාරව වත්කම් අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරිමට හා එම අපේක්ෂිත රටාව පිලිබිඹු වන ක්ෂය කිරීමේ ක්‍රමයක් තෝරාගෙන ක්ෂය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත හා උපකරණ ක්ෂය කර නොතිබුණි. | සියළු වත්කම් ප්‍රත්‍යාගණනයෙන් පසුව 2023 වර්ෂයේදී ක්ෂය කිරීම් හඳුනාගෙන අවසන් ගිණුම් තුළින් ඉදිරිපත් කරන බව. | -එම- |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළ විගණන ගාස්තු වෙන් කිරීම හඳුනාගෙන අවසන් ගිණුම තුළින් ඉදිරිපත් කරන බව. | නිවැරදි ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 වර්ෂයේ මුද්දර ගාස්තු ණයගැතියන් රු.1,000,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළි ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළි ආදායම නිවැරදිව අවසන් ගිණුම තුළ ගලපා ඉදිරිපත් කරන බව. | -එම- |

**1.6.3** විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම් නිසා රු.6,920,625 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරික්ෂා කිරීමට නොහැකි විය. | 2023 ගිණුම් වර්ෂයේ අවසන් ගිනුම් ඉදිරිපත් කිරීමේදී හඳුනාගත් ශේෂයන් ඉදිරිපත් කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.6.4** නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂය එයට අදාළ උපලේඛනය සමඟ සැසදීමේදී රු.549,759,346 ක වෙනසක් විය. | 2023 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන ශේෂ හා උපලේඛණ ශේෂ සමාන විය යුතුවේ. |

**1.7** අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති. රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | | | |
| | 160 වගන්තිය | බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | ඉදිරියේදී දේපළ තහනම් කිරිමේ කටයුතු සිදු කිරීම ආරම්භ කරන බව. | ප්‍රාදේශිය සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කර යුතුවේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 104 | කෙසෙල්වත්ත උපකාර්යාලයේ දිග්ගල තොටුපලේ තිබූ බෝට්ටුව අස්ථානගත වී තිබූ අතර ඒ පිළිබඳව යොමුගත මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | සභාවේ නිලධාරීන් විසින් බෝට්ටුව ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ii) | මුදල් රෙගුලාසි 395 (අ) | සභාවේ ජංගම ගිණුම් 04 කට අදාළව මු.රෙ.395 ප්‍රකාරව බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. | මෙම බැංකු ගිණුම්වලට අදාළ බැංකු සැසඳුම් සකස් කර අවසන් වූ වහාම ඉදිරිපත් කරන බව. | -එම- |
| (ඇ) | 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛය | 2023 ජනවාරි 31 දින වන විට සභාව සතු වාහන 12 ක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම් ඉක්ම වූ වියදම් රු.5,923,009 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම් ඉක්ම වූ වියදම් රු.95,803,562 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | (රු) | (රු) | (රු) | (රු) | (රු) | (රු) | (රු) | (රු) |
| වරිපනම් හා බදු | 31,334,126 | 31,593,211 | 17,290,160 | 14,363,051 | 35,273,461 | 32,055,123 | 33,471,645 | 33,589,942 |
| කුලී | 406,000 | 532,200 | 395,200 | 137,000 | 6,975,550 | 2,287,200 | 16,654,636 | 5,284,163 |
| බලපත්‍ර ගාස්තු | 512,000 | 494,000 | 479,000 | 15,000 | 6,440,000 | 544,000 | 1,586,619 | 64,000 |
| වෙනත් ආදායම් | 2,500,000 | 9,960,000 | 9,960,000 | - | 112,915,000 | 12,915,000 | 151,223,389 | 107,025,408 |
| එකතුව | 34,752,126 | 42,579,411 | 28,124,360 | 14,515,051 | 161,604,011 | 147,801,323 | 202,936,289 | 145,963,513 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 ජනවාරි 01 දිනට සමස්ථ හිඟ වරිපනම් බදු ආදායම රු.33,589,943 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට එය රු.7,038,031 ක් විය. | හිඟයෙන් කොටස් අය කර ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | වරිපනම් වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත්, උප කාර්යාල 02 ක් 2007 වර්ෂයේ සිට හා වාද්දුව උප කාර්යාලය 2014 වර්ෂයේ සිට වරිපනම් තක්සේරුවක් සිදු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | වරිපනම් බදු තක්සේරු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට අයවිය යුතු වෙළඳ ස්ථාන කුලි ආදායම රු.4,652,163 ක් වූ අතර ඉන් රු.4,301,163 ක් හෙවත් සියයට 92 සමාලෝචිත වර්ෂය තුළ අයකර නොතිබුණි. | මෙහි කෙසෙල්වත්ත පොලිස් ස්ථානයේ හිඟ මුදල ඇතුළත් වේ. මේ සම්බන්ධයෙන් දේපළ කළමනාකරණ කොට්ඨාශයේ අධ්‍යක්ෂ වෙත ද දන්වා යවා ඇත. එහෙත් මේ දක්වා ගෙවීම් කර නොමැති අතර මෙම හිඟ මුදල නොගෙවන බව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි විසින් මේ වන විට දැනුම් දී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන සැලැස්ම | | |
| | ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු එක් එක් භාණ්ඩය හා උපකරණ සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණු අතර ප්‍රසම්පාදන කටයුතු සඳහා | ඉදිරියේදී විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කොට ඉදිරිපත් කරන බව. | ප්‍රසම්පාදන සැලැස්මක සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| රුපියල් මිලියන **42** ක මුදලක් වාර්ෂික අය වැය ලේඛනයෙන් වෙන් කර තිබුණි. | | |

(ආ) අත්හැර දැමූ කර්තව්‍යන්

| | | |
|---|---|---|
| **1998** වර්ෂයේ සිට පවතින ජල ප්‍රවහන ගැටළුවක් විසඳීම සඳහා ආරම්භ කළ දිබ්බැද්ද පුඤ්ඤානන්ද මාවතේ කපුගහවත්ත ඉඩමට මායිම් වන රජයේ ඉඩමේ පොදු කාණුව ඉදිකර වැසි ජලය බැස යාමට සැලැස්වීමේ ව්‍යාපෘතිය යටතේ පුද්ගලික ඉඩමක් හරහා දිවයන කාණු කොටස පමණක් රු.**253,577** ක වියදමක් දරා ඉදිකර ව්‍යාපෘතිය අතරමග අතහැර දමා තිබුණි. මේ හේතුවෙන් මාර්ගයේ කාණුවකින් වැසි ජලය පෞද්ගලික ඉඩම තුළට ගලායෑමෙන් වන හානියට අමතරව වැසි ජලය බැස නොයෑමෙන් මාර්ගයද පරිහරණය කළ නොහැකි වී තිබුණි. | අදාළ බිම් තිරය අත්පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කළ යුතුවේ. |

(ඇ) කසළ කළමණාකරණය

| | | |
|---|---|---|
| සභාව විසින් වෙන් කළ කසළ ලෝඩ් **400** ක් සඳහා රු.**4,135,538** ක් ද, කළුකර පොහොරවත්ත මිහිසරු කොම්පෝස්ට් අංගනයටද, ලෝඩ් **418** ක් වෙනුවෙන් රු.**11,988,000** ක් **G.F.C.**මැෂනරි පුද්ගලික ආයතනයටද ගෙවා තිබුණි.මේ අනුව වෙන් කළ කසළලෝඩ් **01** ක් මිහිසරු කොම්පොස්ට් අංගනයට බැහැර කිරීම සඳහා රු.**10,338** ක් වැය වී තිබුණ අතර, **G.F.C.**මැෂනරි ආයතනයට ලෝඩ් **01** ක් බැහැර කිරීමට රු.**26,791** ක් වැය වී තිබුණි. මේ අනුව මුළු වෙන්කළ කසළ ප්‍රමාණයම මිහිසරු කොම්පොස්ට් අංගනයට | ටිපර් රථයක් නොමැතිවීම හේතුවෙන් මෙම තත්වය උද්ගත වී ඇති අතර දිරණ කසළ පුද්ගලික අංශය වෙත ලබා දීම වැලැක්වීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති බව. | කාර්යක්ෂමව කසළ බැහැර කිරීමේ ක්‍රමයක් යොදාගත යුතුය. |

| | | |
|---|---|---|
| බැහැර කලේ නම් සභාවට රු.8,131,354 ක් ඉතිරි කර ගත හැකිව තිබුණි. | | |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති හා අක 4/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතනය සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු බව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති හා අංක LGD/10A/4/න.ගි/2019 දරන ලිපිය අනුව දන්වා ඇතත් සභාව විසින් 2022 වර්ෂයේදීද ඇතැම් වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. එමෙන්ම මෝටර් රථ හැර අනෙක් වත්කම් ක්ෂය කර නොතිබුණි. | 2022 වර්ෂයේ වාහන ප්‍රත්‍යාගණනය කරන ලදී. අනෙක් වත්කම් ප්‍රත්‍යාගණන කිරීම සඳහා කල්වේලා නොතිබුණ බැවින් 2023 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර ක්ෂය කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ 11 වන පරිච්ඡේදයේ 3.8 වගන්තිය ප්‍රකාරව සේවක ස්ථාන මාරුවීම් සිදු කළ යුතු වුවත්, 2022 වර්ෂය අවසාන වන විය සේවයේ නියුතු MN 01 වැටුප් කලය හා ඊට ඉහල වැටුප් කලයේ නිලධාරින් අතරින් අඛණ්ඩව වසර 07 කට අධික කාලයක් ස්ථාන මාරුවීම් ලබා නොගත් නිලධාරින් 16 දෙනෙකු සිටින බව නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ සිට රට තුළ පැවති ආර්ථික හා දේශපාලන අස්ථාවරතාවය මත ප්‍රදාන ලේකම් (බ.ප) වර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක නොවූ බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සේවක ණය | | |
| | විශ්‍රාම ගිය, සේවය හැරගිය හා ස්ථානමාරු වී ගිය සේවකයින් 12 | සේවක ණය ශේෂ උප ලේඛනය සමඟ නිවැරදි කර අවසාන ගිණුමට | හිඟ ණය ශේෂ අය කර ගරනීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| **දෙනෙකුගේ 2008 වර්ෂයේ සිට 2022 දක්වා අයවිය යුතුව පැවති රු.911,754 ක මුදල්ක් 2022 දෙසැම්බර් වන විටත් අයකර නොතිබුණි.** | **ගලපා ඉදිරිපත් කරන බව.** | **යුතුය.** |